COMPLETED

BY........................

ON.........................

36488

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

33 S L

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two hours

විභාග අංකය : ................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලැබූ ලකුණු |
| 1 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

උපදෙස්:

- ※ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ※ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ විභාග අංකය, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

1. දෙන ලද කාලපරිච්ඡේදයක් සඳහා ආයතනයක මූල්‍ය තත්ත්වයේ වෙනස්වීම මගින්
   (1) උපයන ලද ලාභයේ
   (2) මුළු වත්කම්වල
   (3) හිමිකම සහ වගකීම්වල
   (4) ණය ලබා ගැනීම්වල
   (5) මුදල් ප්‍රවාහවල
   
   වෙනස්වීම පෙන්නුම් කරයි. (.........)

- ප්‍රශ්න අංක 2 හා 3 සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.
  රුපියල් මිලියන 75 ක ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිතව, 2009.04.01 දින එහි ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද සමාගමක් 2010/11 සහ 2009/10 යන වර්ෂ සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| විස්තරය | 2010/11 (රු. මිලියන) | 2009/10 (රු. මිලියන) |
|---|---|---|
| මුළු ආදායම | 150 | 100 |
| මුළු වියදම (ආදායම් බදු හැර) | 90 | 120 |
| ආදායම් බදු | 20 | – |
| ගෙවූ ලාභාංශ | 10 | – |
| ප්‍රත්‍යාගණන සංචිත (මාර්තු 31 දිනට) | 15 | – |
| මුළු වත්කම් (මාර්තු 31 දිනට) | 150 | 80 |

2. 2010.03.31 දිනට මුළු වගකීම් කොපමණ ද?
   (1) රු. මිලියන 5
   (2) රු. මිලියන 15
   (3) රු. මිලියන 20
   (4) රු. මිලියන 25
   (5) රු. මිලියන 60 (.........)

3. 2011.03.31 දිනට හිමිකම කොපමණ ද?
   (1) රු. මිලියන 85
   (2) රු. මිලියන 95
   (3) රු. මිලියන 100
   (4) රු. මිලියන 115
   (5) රු. මිලියන 120 (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

4. ආයතනයක, 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ රු. 10 000 000 ක ලාභයක් පෙන්වන ලදී. 2011.03.31 දිනට තොගයෙහි ඇතුළත් වූ පිරිවැය රු. 2 000 000 ක් සහිත අයිතම සම්බන්ධයෙන් පහත තොරතුරු අදාළ වේ.
   * මෙම අයිතමවල කල් ඉකුත්වන දිනය 2011.04.30 දින විය.
   * මේවායින් 50% ක් 2011.04.30 දිනට පෙර රු. 200 000 ක විකුණුම් වියදමක් දරමින් රු. 1 000 000 කට විකුණා ඇත.
   * ඉතිරි අයිතම සඳහා විකුණුම් වටිනාකමක් නොමැත.

   ඉහත තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසු 2011.03.31 දිනට ඉහත අයිතමයන්ගේ තොග අගය හා වර්ෂයේ ලාභය පිළිවෙළින් කොපමණ ද? (ඒ වන විට මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කර නොමැති බව උපකල්පනය කරන්න.)

| | තොගය (රු. '000) | ලාභය (රු. '000) |
|---|---|---|
| (1) | 800 | 8 800 |
| (2) | 1 000 | 9 000 |
| (3) | 1 200 | 9 200 |
| (4) | 2 000 | 9 800 |
| (5) | 2 000 | 10 000 |

(.........)

5. තොග පාලනය සඳහා මෘදුකාංග පද්ධතියක් වැඩිදියුණු කිරීම වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී ආයතනයක් රු. **මිලියන** 4ක් වැයකරන ලදී. මෙම මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම සම්පූර්ණ කිරීම සඳහා තවත් රු. **මිලියනයක්** වැයකිරීමට බලාපොරොත්තුවන අතර ඊළඟ වසර අවසාන වන විට එය භාවිත කළ හැකිවේ. මේ හා සමාන වූ මෘදුකාංග පද්ධතියක වෙළඳපොළ මිල රු. **මිලියන 6** කි.

   ඉහත තොරතුරුවලට අනුව ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු වන්නේ
   (1) රු. මිලියන 4 ක වත්කමකි.
   (2) රු. මිලියන 4 ක වියදමකි.
   (3) රු. මිලියන 5 ක වත්කමකි.
   (4) රු. මිලියන 5 ක වියදමකි.
   (5) රු. මිලියන 6 ක වත්කමකි.

(.........)

6. සමාගමක වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය **නිවැරදි ද?**
   (1) වාර්ෂිකව පිළියෙල කරන බැවින් ඒවා "පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන" ලෙස හඳුන්වයි.
   (2) අභ්‍යන්තර පාර්ශවයන් සඳහා පිළියෙල කරන බැවින් ඒවා "විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන" ලෙස හඳුන්වයි.
   (3) සමාගමට ආවේනික වූ නිශ්චිත ගිණුම්කරණ මග පෙන්වීම්, රීතීන් හා ව්‍යුහයන් අනුව ඒවා පිළියෙල කරනු ලැබේ.
   (4) කොටස් හිමියන්ට පමණක් ඉදිරිපත් කරන බැවින් ඒවා "විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන" ලෙස හඳුන්වයි.
   (5) ඇලුම්කරන පාර්ශවයන්ගේ පොදු තොරතුරු අවශ්‍යතා සපුරාලන බැවින් ඒවා "පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන" ලෙස හඳුන්වයි.

(.........)

- ප්‍රශ්න අංක **7** සහ **8** සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.

ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා ආයතනයක නිෂ්පාදන පිරිවැය පහත පරිදි ගණනය කර ඇත.

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 800 |
| සෘජු වේතන | 200 |
| අනෙකුත් පරිවර්තන පිරිවැය | 300 |
| කාලපරිච්ඡේදය තුළ තොගයේ ශුද්ධ වෙනස්වීම | |
| - අමුද්‍රව්‍ය | (50) |
| - නොනිමි වැඩ | 150 |
| - නිමි භාණ්ඩ | 100 |
| නිෂ්පාදන පිරිවැය | **1 500** |

* ඉහත පිරිවැය ගණනය කරන විට පහත සඳහන් අතිරේක තොරතුරු සැලකිල්ලට ගෙන නොමැත.
  - තොග හැසිරවීමේ දුර්වලතා හේතුවෙන් රු. 40 000 ක අමුද්‍රව්‍ය සම්පූර්ණයෙන් ම හානි වී තිබීම.
  - නිෂ්පාදනයේදී භාවිත කළ යන්ත්‍ර සඳහා වූ රු. 20 000 ක වාර්ෂික ක්ෂය මග හැරීම.
  - නිෂ්පාදනයට අදාළ රු. 60 000 ක් වූ විදුලි වියදම් ගිණුම්ගත කර නොතිබීම.
  - රු. 80 000 ක් වූ කාර්යාලීය කුලී, අනෙකුත් පරිවර්තන පිරිවැයෙහි ඇතුළත් වී තිබීම.
  - කාලපරිච්ඡේදය අවසානයේ නොනිමි තොග රු. 30 000 කින් අවතක්සේරු වී තිබීම.

[ තුන්වෙනි පිටුව බලන්න.

7. ඉහත අතිරේක තොරතුරු සැලකීමට පෙර කාලපරිච්ඡේදයේ විකුණුම් පිරිවැය කොපමණ ද?
   (1) රු. 1 250 000
   (2) රු. 1 300 000
   (3) රු. 1 350 000
   (4) රු. 1 400 000
   (5) රු. 1 500 000 (.........)

8. ඉහත අතිරේක තොරතුරු සැලකීමට පසු කාලපරිච්ඡේදයේ නිෂ්පාදන පිරිවැය කොපමණ ද?
   (1) රු. 1 330 000
   (2) රු. 1 390 000
   (3) රු. 1 400 000
   (4) රු. 1 410 000
   (5) රු. 1 470 000 (.........)

9. ආයතනයක් විසින් සියලු මුදල් ලැබීම් දිනපතා බැංකුගත කරන අතර සියලු ගෙවීම් චෙක්පත් මගින් සිදුකරනු ලබයි. මාසයකට අදළ තොරතුරු පහත දී ඇත.
   * මාසය ආරම්භයේ, බැංකු ප්‍රකාශනයට හා මුදල් පොතට අනුව, ශේෂ පිළිවෙළින් රු. 10 000 ක් හා රු. 25 000 ක් විය. මෙම ශේෂ අතර වෙනසට හේතුව වූයේ උපලබ්ධි නොවූ චෙක්පත් ය.
   * මුදල් ලැබීම් ජර්නලයේ එකතුව - රු. 150 000
   * මුදල් ගෙවීම් ජර්නලයේ එකතුව - රු. 90 000
   * ණයගැතියන්ගෙන් මුදල් එකතුකර ගැනීමේදී ලබාදුන් වට්ටම් - රු. 5 000
   * මාසය අවසානයේ මුදල් පොතේ ශේෂය හා බැංකු ප්‍රකාශනයෙහි ශේෂය අතර වෙනසට එකම හේතුව වූයේ බැංකු ප්‍රකාශනයේ දක්වා ඇති රු. 10 000 ක් වූ බැංකු ගාස්තු පමණි.

   බැංකු ප්‍රකාශනයට අනුව මාසය අවසානයේ ශේෂය කොපමණ ද?
   (1) රු. 55 000
   (2) රු. 60 000
   (3) රු. 65 000
   (4) රු. 70 000
   (5) රු. 75 000 (.........)

10. 2010.04.01 දින ආරම්භකරන ලද සමාගමක් 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 250 000 ක ලාභයක් වාර්තා කර ඇත. 2011.03.31 දිනට මුළු වත්කම් පහත දැවලින් සමන්විත විය. එදිනට කිසිදු වගකීමක් නොතිබුණි.

| | රු. |
|---|---|
| උපකරණ (පිරිවැය රු. 640 000) | 600 000 |
| තොගය | 200 000 |
| මුදල් | 350 000 |

   2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් **ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** කොපමණ ද?
   (1) රු. 10 000
   (2) රු. 50 000
   (3) රු. 90 000
   (4) රු. 250 000
   (5) රු. 350 000 (.........)

11. ඊළඟ වර්ෂයේදී දියත්කිරීමට නියමිත ප්‍රචාරණ ව්‍යාපෘතියක් සඳහා ප්‍රවර්තන වර්ෂයේදී වැයකරන ලද විශාල මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් පහත සඳහන් කුමක් නිවැරදි ද?
   (1) වත්කමක් ලෙස හඳුනාගැනීම.
   (2) ඊළඟ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම.
   (3) නිෂ්පාදිතයේ පොදුකාර්ය ලෙස හඳුනාගැනීම.
   (4) ප්‍රවර්තන වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම.
   (5) වත්කමක් ලෙස හඳුනාගැනීමෙන් පසුව ක්‍රමක්ෂය කිරීම. (.........)

12. ව්‍යාපාරයක හවුල්කරුවන් වන **අනුර** සහ **බාලා** සම සමව ලාභ බෙදාගන්නා බැවින් ලාභය ජංගම ගිණුම්වලට මාරුකිරීම වෙනුවට **'රැඳවූ ලාභ'** ගිණුමක් පවත්වා ගැනීමට එකඟ විය. ගැනිලි වාර්තා කිරීමට එක් එක් හවුල්කරුවන් සඳහා වෙන ම ගිණුම් පවත්වා ගනී. 2010.04.01 දින සමාන ලාභ කොටසක් සඳහා නව හවුල්කරුවකු ලෙස **චමල්** ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. 2011.03.31 දින රැඳවූ ලාභ ගිණුම හා ගැනිලි ගිණුම් වසා දැමීමටත් එම ශේෂයන් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වලට මාරු කිරීමටත් එකඟ විය. මාර්තු 31 දිනට පහත ගිණුම් ශේෂයන් දී ඇත.

| | **2011** (රු.) | **2010** (රු.) |
|---|---|---|
| රැඳවූ ලාභ ගිණුම | 150 000 | 90 000 |
| ගැනිලි ගිණුම - අනුර | 20 000 | 20 000 |
| - බාලා | 35 000 | 25 000 |
| - චමල් | 10 000 | – |

2011.03.31 දිනට බාලා සහ චමල්ගේ ජංගම ගිණුම් ශේෂ පිළිවෙළින්

(1) හර රු.30 000 සහ හර රු. 10 000 කි.
(2) බැර රු. 30 000 සහ හර රු. 10 000 කි.
(3) බැර රු. 30 000 සහ බැර රු. 10 000 කි.
(4) හර රු. 10 000 සහ බැර රු. 40 000 කි.
(5) හර රු. 60 000 සහ හර රු. 10 000 කි. (.........)

13. හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය සඳහා ගැලපීම සිදුකරනුයේ,

(1) කීර්තිනාමය අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන බැවිනි.
(2) කීර්තිනාමයේ අගය කලින් කලට වෙනස්වන බැවිනි.
(3) සියලු හවුල්කරුවන්ගේ හිමිකමට ඇති ඇල්ම සාධාරණ ලෙස තහවුරු කළ යුතු බැවිනි.
(4) ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන් පෞද්ගලිකව උපයන බැවිනි.
(5) කීර්තිනාමය හවුල්කරුවන් අතර සමානව බෙදිය යුතු බැවිනි. (.........)

14. 2008.04.01 දින රු. 500 000 කට අත්පත් කර ගෙන තිබූ දේපළ, 2010.04.01 දින ප්‍රථමවතාවට රු. 640 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙදිනට දේපළ සඳහා ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු. 100 000 ක් විය. දේපළ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. ප්‍රත්‍යාගණන අවස්ථාවේදී මෙම වත්කමේ ඉතිරි ඵලදායි ජීව කාලය අවුරුදු 8 ක් විය. මෙම ප්‍රත්‍යාගණනය නිසා 2011.03.31 දිනට හිමිකමට ඇති වන ශුද්ධ බලපෑම කුමක් ද?

(1) රු. 30 000 ක් අඩුවීම.
(2) රු. 80 000 ක් අඩුවීම.
(3) රු. 140 000 ක් වැඩිවීම.
(4) රු. 210 000 ක් වැඩිවීම.
(5) රු. 240 000 ක් වැඩිවීම. (.........)

15. පහත සඳහන් තොරතුරු ආයතනයක් විසින් අත්පත්කර ගන්නා ලද යන්ත්‍රයකට අදාළ වේ.

| | **රු.'000** |
|---|---|
| ගැනුම් මිල ........................................ | 2 000 |
| ගැනුම් මිලෙන් අඩුකළ වෙළෙඳ වට්ටම ........................................ | 100 |
| සවිකිරීමේ පිරිවැය ........................................ | 1 200 |
| භාවිතයට පෙර යන්ත්‍ර අත්හද බැලීමේ පිරිවැය ........................................ | 150 |
| යන්ත්‍රය භාවිතයේදී සිදුකළ අමතර කොටස් ප්‍රතිෂ්ඨාපනය ........................................ | 250 |
| වාර්ෂික නඩත්තු ........................................ | 100 |

මෙම යන්ත්‍රය වත්කමක් ලෙස හඳුනාගත යුත්තේ කුමන වටිනාකමට ද?

(1) රු. 3 100 000
(2) රු. 3 250 000
(3) රු. 3 350 000
(4) රු. 3 500 000
(5) රු. 3 800 000 (.........)

[ පස්වෙනි පිටුව බලන්න.

16. මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පනාත්මක රාමුවක් ගොඩනැගීමට හේතුවන්නේ පහත කරුණුවලින් මොනවා ද?
A. ගිණුම්කරණ ප්‍රමිත සැකසීම සඳහා පදනම සැපයීම.
B. මූල්‍ය ප්‍රකාශන භාවිත කරන්නන්ට ඒවා හොඳින් අවබෝධ කරගැනීමේ හැකියාව ලබාදීම.
C. අදාළ ගිණුම්කරණ ප්‍රමිත නොමැති අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට මග පෙන්වීම.
D. මූල්‍ය තොරතුරුවල ගුණාත්මකභාවය වැඩිකිරීම සඳහා න්‍යායාත්මක පදනමක් සැපයීම.
(1) A හා B පමණි.
(2) C හා D පමණි.
(3) A, B හා D පමණි.
(4) A, B හා C පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම. (.........)

• ප්‍රශ්න අංක **17** සහ **18** ට පිළිතුරු සැපයීම සඳහා ආයතනයක තොග අයිතමයකට අදාළ පහත තොරතුරු භාවිත කරන්න.

| දිනය | විස්තරය | ඒකක ගණන | ඒකක පිරිවැය (රු.) |
|---|---|---|---|
| 2010.01.01 | ශේෂය | 2 000 | 50 |
| 2010.01.14 | ගැනුම් | 4 000 | 80 |
| 2010.01.20 | ගැනුම් | 6 000 | 90 |
| 2010.01.31 | ශේෂය | 1 000 | – |

ජනවාරි 21 දින හා 31 දින අතර ඒකක 11 000 ක් විකුණා ඇත.

17. තොග නිකුත්කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය මිල ක්‍රමය භාවිත කළේ නම්, 2010.01.31 දිනට තොගයේ පිරිවැය කොපමණ ද?
(1) රු. 50 000
(2) රු. 73 000
(3) රු. 80 000
(4) රු. 86 000
(5) රු. 90 000 (.........)

18. තොග නිකුත් කිරීම සඳහා ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය (FIFO) භාවිත කළේ නම්, 2010.01.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **'විකුණුම් පිරිවැය'** කොපමණ ද?
(1) රු. 550 000
(2) රු. 860 000
(3) රු. 870 000
(4) රු. 960 000
(5) රු. 990 000 (.........)

19. සමාගමක අධ්‍යක්ෂවරු 2011.06.30 දින, 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අත්සන් කරන ලදී. 2011.07.15 දින පැවති වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී. පහත සිද්ධීන් පිළිබඳ තොරතුරු ලබා දී ඇත.
A - ගංවතුර හේතුවෙන් 2011.05.20 දින රු. 250 000 ක් වූ කාර්යාල උපකරණ හානි වී ඇත.
B - ගනුදෙනුකරුවකු විසින් සමාගමට එරෙහිව 2009 දී පවරන ලද නඩුවක් සම්බන්ධයෙන් තීන්දුව 2011.06.15 දින දී ලබා දෙන ලදී. ඒ අනුව සමාගම විසින් රු. 150 000 ක වන්දියක් ගෙවිය යුතු බවට තීන්දු කරන ලදී.
C - 2011.03.31 දිනට රු. 300 000 ක ශේෂයක් තිබූ ගනුදෙනුකරුවකු 2011.07.05 දින **'බුන්වත් වූ බව'** ප්‍රකාශ කරන ලදී. ශේෂ පත්‍ර දිනට, සමාගම මේ සඳහා සම්පූර්ණ වෙන්කිරීමක් සිදුකර තිබුණි.

ඉහත කුමන සිදුවීම් සඳහා 2011.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු ද?
(1) A පමණි.
(2) A හා B පමණි.
(3) B පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ල ම. (.........)

20. ශක්‍ය ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති නව නිෂ්පාදන ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා දරන ලද පහත පිරිවැය වලින් කුමක් **"සංවර්ධන පිරිවැය"** ලෙස ප්‍රාග්ධනිත කළ හැකි ද?

A. නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා භාවිත කරන ලද අමුද්‍රව්‍ය.

B. නිෂ්පාදන ක්‍රියාවලියට සේවකයන් හුරු කිරීම සඳහා දරන ලද පුහුණු කිරීමේ පිරිවැය.

C. නිෂ්පාදන ක්‍රියාවලියේ ශක්‍යතාව ඇගයීම් සඳහා දරන ලද උපදේශන ගාස්තු.

D. නිෂ්පාදන ක්‍රියාවලිය ඇතිකිරීම සඳහා භාවිත කරන ලද විද්‍යාගාර උපකරණ ක්ෂය.

(1) A සහ C පමණි.
(2) A සහ D පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, C සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ල ම. (.........)

21. ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට ප්‍රවර්තන වර්ෂයේ දී වෙනස්කරන ලදී. ඉහත වෙනස්වීම මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුත්තේ

(1) එය ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනසක් වන බැවින්, පෙර කලපරිච්ඡේදවල ය.
(2) එය ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනසක් වන බැවින් අනාගත කාලපරිච්ඡේදවල ය.
(3) එය ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් වන බැවින්, අනාගත කාලපරිච්ඡේදවල ය.
(4) එය ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් වන බැවින් ප්‍රවර්තන හා අනාගත කාලපරිච්ඡේදවල ය.
(5) එය ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනසක් වන බැවින් පෙර කාලපරිච්ඡේදවල හා ප්‍රවර්තන කාලපරිච්ඡේද තුළ ය.

(.........)

22. විකුණුම් කොමිස් වැරදීමකින් විකුණුම් ගිණුමට හර කළේ නම් පහත කුමක් අවතක්සේරු විය හැකිද?

(1) දළ ලාභය
(2) වර්ෂයේ ලාභය
(3) ණයගැතියන්ගෙන් එකතු කළ මුදල්
(4) හිමිකම
(5) විකුණුම් පිරිවැය (.........)

23. පහත සඳහන් තොරතුරු සමාගමක කොටස් නිකුතුවකට අදාළ වේ.

| | |
|---|---|
| අයදුම් කළ කොටස් ගණන | 2 000 000 |
| කොටසක නිකුතු මිල | රු. 10 |
| ප්‍රතික්ෂේප කළ කොටස් ගණන | 200 000 |
| විභජනය කළ කොටස් ගණන (අතිරික්ත කොටස් සඳහා ලද මුදල් ආපසු යවන ලදී.) | 1 000 000 |
| කොටස් නිකුතු වියදම් | රු. 500 000 |

මෙම කොටස් නිකුතුව මගින් සමාගමේ ශුද්ධ වත්කම්වලට ඇතිවන ශුද්ධ බලපෑම කොපමණ ද?

(1) රු. මිලියන 9.5
(2) රු. මිලියන 10
(3) රු. මිලියන 10.5
(4) රු. මිලියන 17.5
(5) රු. මිලියන 19.5 (.........)

24. පහත සඳහන් තොරතුරු පාදකව, 2011.03.31 දිනට කල්බදු ගැනුම්කරුගේ පොත්වල මුළු වගකීම කොපමණ ද?

| | |
|---|---|
| කල්බදු වර්ගය | මූල්‍ය |
| කල්බදු ගිවිසුම් දිනය | 2010.03.31 |
| කල්බදු කාලය | අවුරුදු 4 |
| වාර්ෂික කල්බදු වාරිකය | රු. 500 000 |
| පළමු වාරිකය ගෙවූ දිනය | 2011.03.31 |
| 2010.03.31 දිනට අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය | රු. 1 200 000 |
| 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොලිය | රු. 290000 |

(1) රු. 500 000
(2) රු. 790 000
(3) රු. 990 000
(4) රු. 1 200 000
(5) රු. 1 790 000 (.........)

[ හත්වෙනි පිටුව බලන්න.

25. පහත සඳහන් සමීකරණවලින් මුළු පිරිවැය නියෝජනය **නොකරන්නේ** කුමකින් ද?
(1) මුළු පිරිවැය = නිෂ්පාදිත පිරිවැය + නිෂ්පාදන නොවන පිරිවැය
(2) මුළු පිරිවැය = නිෂ්පාදන පිරිවැය + නිෂ්පාදන නොවන පිරිවැය
(3) මුළු පිරිවැය = ප්‍රාථමික පිරිවැය + මුළු පොදුකාර්ය පිරිවැය
(4) මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
(5) මුළු පිරිවැය = නිෂ්පාදන පිරිවැය + මුළු පොදුකාර්ය පිරිවැය (………)

26. පිරිවැය, පරිමා හා ලාභ (CVP) විශ්ලේෂණයේදී, **දායකය** යනු;
(1) විකුණුම් ආදායම සහ ලාභය අතර වෙනස ය.
(2) විකුණුම් ආදායම සහ මුළු පිරිවැය අතර වෙනස ය.
(3) විකුණුම් ආදායම සහ ස්ථාවර පිරිවැය අතර වෙනස ය.
(4) විකුණුම් ආදායම සහ විචල්‍ය පිරිවැය අතර වෙනස ය.
(5) විකුණුම් ආදායම සහ විකුණුම් පිරිවැය අතර වෙනස ය. (………)

27. පොදුකාර්ය අන්තර්ග්‍රහණය කිරීම සඳහා සමාගමක් **'යන්ත්‍ර පැය අනුපාතය'** භාවිත කරයි. ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන හා පොදුකාර්ය පිළිවෙළින් 15 000 ක් හා රු. 300 000 ක් විය. පැය 20 000 ක් සඳහා යන්ත්‍ර ක්‍රියාකරන ලදී. සත්‍ය පොදුකාර්ය රු. 360 000 ක් විය.
පොදුකාර්ය අධි / (ඌන) අන්තර්ග්‍රහණය කොපමණ ද?
(1) රු. (40 000)
(2) රු. (60 000)
(3) රු. 40 000
(4) රු. 60 000
(5) රු. 100 000 (………)

28. භාණ්ඩ ඒකකයක සෘජු ද්‍රව්‍ය හා සෘජු ශ්‍රම පිරිවැයෙහි එකතුව රු. 160 කි. ඒකකයකට රු. 50 බැගින් වූ නිෂ්පාදන පුරස්කාරයක් ද ගෙවිය යුතුය. ඒකකයක් නිෂ්පාදනය සඳහා ඒ ඒ දෙපාර්තමේන්තුව තුළදී ගත කළ කාලය හා පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාත පහත දී ඇත.

| දෙපාර්තමේන්තුව | ශ්‍රම පැය | යන්ත්‍ර පැය | පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය |
|---|---|---|---|
| යන්ත්‍ර | 8 | 10 | යන්ත්‍ර පැයකට රු. 15 බැගින් |
| එකලස් | 10 | 5 | යන්ත්‍ර පැයකට රු. 12 බැගින් |
| නිමැවුම් | 6 | 2 | ශ්‍රම පැයකට රු. 5 බැගින් |

මෙම නිෂ්පාදිතයේ ඒකක පිරිවැය කුමක් ද?
(1) රු. 350 (2) රු. 400 (3) රු. 430 (4) රු. 450 (5) රු. 480 (………)

29. පහත තොරතුරුවලට අනුව ආයතනයේ **'මුදල් චක්‍රය'** කොපමණ ද?

| | |
|---|---|
| කාලපරිච්ඡේදයේ ආරම්භක තොගය (රු.) | 10 000 |
| කාලපරිච්ඡේදයේ අවසාන තොගය (රු.) | 15 000 |
| කාලපරිච්ඡේදයේ මුළු ගැනුම් (රු.) | 130 000 |
| ණයහිමියන්ගේ සාමාන්‍ය අගය (රු.) | 6 500 |
| ණයඑකතු කිරීමේ කාලය (දින) | 30 |
| සියලුම ගැනුම් ණයට සිදු වේ. වර්ෂයකට දින 360 ක් සේ සලකන්න. | |

(1) දින 18 කි. (2) දින 48 කි. (3) දින 66 කි. (4) දින 78 කි. (5) දින 84 කි. (………)

30. 2011.03.31 දිනට ආයතනයක මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙළින් රු. 1 000 000 ක් හා රු. 300 000 ක් විය. මෙම සංඛ්‍යාවලට එළඹීමේදී පහත වැරදීම් සිදුවී ඇත.
- 2011 අප්‍රේල් මාසයේ දී භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනුකරුවකුගෙන් ලබාගත් රු. 20 000 ක අත්තිකාරම්, අයභාරය ලෙස හඳුනාගෙන තිබීම.
- 2011 මාර්තු මාසය සඳහා වූ රු. 5 000 ක විදුලි බිල, වාර්තාවලින් මගහැරී තිබීම.
- රු. 10 000 ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජර්නලයේ දෙවතාවක් වාර්තා කර තිබීම.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු **'මුළු වත්කම්'** හා **'මුළු වගකීම්'** පිළිවෙළින් කොපමණ ද?
(1) රු. 990 000 සහ රු. 325 000 කි.
(2) රු. 990 000 සහ රු. 310 000 කි.
(3) රු. 1 025 000 සහ රු. 310 000 කි.
(4) රු. 1 020 000 සහ රු. 300 000 කි.
(5) රු. 1 000 000 සහ රු. 325 000 කි. (………)

[ අටවෙනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ **කෙටි පිළිතුරු තිත් ඉරිමත** සපයන්න.

31. වගකීම් සහ හිමිකම් අතර සමානකමක් සහ වෙනස්කමක් දක්වන්න.

(අ) සමානකම : ........................................................................................................

(ආ) වෙනස්කම : ........................................................................................................

32. රු. 1 000 000 කට අත්පත්කරගෙන තිබූ සහ 2010.03.31 දින පළමුවන වතාවට ප්‍රත්‍යාගණනය කර තිබූ ඉඩමක් 2011.03.31 දින නැවත ප්‍රත්‍යාගණනය කරන ලදී. දෙවන ප්‍රත්‍යාගණනය නිසා ඉඩමේ ධාරණ වටිනාකම රු. 1 200 000 ක් වූ අතර දෙවන ප්‍රත්‍යාගණනයෙන් ජනනය වූ අතිරික්තය රු. 500 000 කි.

(අ) ප්‍රථම වතාවට මෙම ඉඩම ප්‍රත්‍යාගණනය කළ අගය කුමක් ද?

රු. ........................................................................................................

(ආ) දෙවන ප්‍රත්‍යාගණනයෙන් පසු 2011.03.31 දිනට **'ප්‍රත්‍යාගණන සංචිත'** ගිණුමේ ශේෂය කුමක් ද?

රු. ........................................................................................................

33. ආයතනයක් 2005.04.01 දින රු. 320 000 කට යන්ත්‍රයක් අත්පත්කරගෙන තිබුණි. එහි ප්‍රයෝජනවත් ජීව කාලය අවුරුදු 8ක් වූ අතර සුන්බුන් අගයක් නොවීය. යන්ත්‍රයේ කාර්යක්ෂමතාව වැඩිකරමින්, 2010.04.01 දින රු. 80 000 ක නවීකරණ පිරිවැයක් දරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවුරුදු 2 කින් වැඩි විය. යන්ත්‍ර සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලැබේ.

**2011.03.31 දිනට** පහත සඳහන් ගිණුම්වල ශේෂයන් ගණනය කරන්න.

(අ) යන්ත්‍ර - රු.

........................................................................................................

(ආ) යන්ත්‍ර ක්ෂය වෙන්කිරීමේ ගිණුම - රු.

........................................................................................................

34. 2010.03.31 දිනට ධාරණ වටිනාකම රු. 300 000 ක් වූ වාහනයක් රු. 400 000 ක එකඟ වූ අගයකට පවරමින් හා රු. 200 000 ක් මුදලින් ගෙවමින් 2010.10.01 දින නව යන්ත්‍රයක් අත්පත් කරගන්නා ලදී. යන්ත්‍ර වර්ෂයට 20% බැගින් පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර පවරා දුන් මෝටර් රථයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය රු. 100 000 කි.

**පහත සඳහන් දෑ ගණනය කරන්න.**

(අ) 2011.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම - රු.

........................................................................................................

(ආ) මෝටර් රථය හුවමාරු කිරීමේ ලාභය හෝ අලාභය - රු.

........................................................................................................

35. පහත දී ඇත්තේ සීමිත සේන පුද්ගලික සමාගමේ ආදායම් ප්‍රකාශනයයි. A, B, C හා D යන අක්ෂරවලින් දක්වා ඇති එක් එක් ලක්ෂ්‍යයේදී යෙදවී ඇති ගිණුම්කරණ සංකල්පයක් ලියා දක්වන්න.

**සීමිත සේන පුද්ගලික සමාගම (A)**

**2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (B)**

| | රු. '000 |
|---|---|
| **විකුණුම්** | **1 000 (C)** |
| විකුණුම් පිරිවැය | **(600)** |
| දළ ලාභය | 400 |
| **වියදම්** | **(150) (D)** |
| වර්ෂයේ ලාභය | 250 |

| **ලක්ෂ්‍යය** | **ගිණුම්කරණ සංකල්පය** |
|---|---|
| A | ........................................................ |
| B | ........................................................ |
| C | ........................................................ |
| D | ........................................................ |

36. වගුවෙහි දී ඇති එක් එක් තත්ත්වය වඩාත් හොඳින් විස්තර කරනු ලබන පහත දක්වා ඇති, ගිණුම්කරණ මූලධර්මයට, අනුරූපී අක්ෂරය සඳහන් කරන්න.

A - සංසන්දනාත්මක බව

B - ආකෘතියට වඩා හරය වැදගත් බව

C - විචක්ෂණභාවය

D - අදාළ බව

| තත්ත්වය | අනුරූපී අක්ෂරය |
|---|---|
| වත්කමක් එහි වෙළඳපොළ අගයට හඳුනාගැනීම | ............... |
| මූල්‍ය කල්බද්දක් යටතේ අත්පත් කරගන්නා ලද වත්කම් එහි අනුරූපී වගකීම් සමඟ හඳුනාගැනීම | ............... |
| මූල්‍ය ප්‍රකාශනවල පසුගිය වර්ෂයේ සංඛ්‍යා වාර්තා කිරීම | ............... |
| ණයගැතියන්ගේ අයකර ගැනීමේ හැකියාව තක්සේරු කර ගැලපීම් සිදුකිරීම | ............... |

37. 2011 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පිරිවැය රු. 225 000 ක් වූ සම්පූර්ණයෙන් ම හානිවූ තොගයක්, 2010 වර්ෂයේ අවසාන තොගයේ ඇතුළත්ව තිබූ බව දැනගන්නට ලැබී ඇත. මෙම අලාභය හානිපූර්ණය සඳහා රු. 200 000 ක් ගෙවීමට 2010 වසරේදී රක්ෂකයා එකඟ වී තිබුණි. කෙසේ නමුත් හානිවූ තොගය හා රක්ෂණ වන්දිය සම්බන්ධයෙන් කිසිම ගැලපීමක් සිදුකර නොමැත.

ඉහත වරද නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන ලියන්න.

................................................................................

................................................................................

................................................................................

38. පහත සඳහන් තොරතුරු ව්‍යාපෘතියකට අදාළ වේ.

| විස්තරය | රු. |
|---|---|
| සාමාන්‍ය වාර්ෂික ලාභය | 90 000 |
| සාමාන්‍ය ආයෝජනය | 300 000 |
| මුදල් ප්‍රවාහ ගලාඒම්වල වර්තමාන අගය | 400 000 |
| මුදල් ප්‍රවාහ ගලායෑම්වල වර්තමාන අගය | 500 000 |

අපේක්ෂිත ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය 25% කි.

පහත එක් එක් ක්‍රමය යටතේ මෙම ව්‍යාපෘතිය පිළිගත යුතුද නැද්ද යන්න හේතුව සමඟින් දක්වන්න.

| ක්‍රමය | පිළිගනී නම් (✓) ලකුණ ද පිළිනොගනී නම් (×) ලකුණ ද යොදන්න. | හේතුව |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය | ......................... | ......................... |
| ශුද්ධ වර්තමාන අගය | ......................... | ......................... |

39. දුරකථන සන්නිවේදන සේවා සපයන සමාගමක් ගනුදෙනුකරුවන්ට අන්තර්ජාල සම්බන්ධතාව ලබා දෙන අවස්ථාවේ දී අන්තර්ජාල භාවිතය වෙනුවෙන් මාස දෙකක ගාස්තු කලින් අයකරයි. අන්තර්ජාල භාවිතය සඳහා මාසික ගාස්තුව රු. 600 කි. 2011.03.01 දින ගනුදෙනුකරුවන් 10 දෙනෙකු මෙවැනි සම්බන්ධතා ලබාගන්නා ලදී. සියලු අයකිරීම් ලද අත්තිකාරම් ගිණුමකට පිටපත් කරනු ලැබේ. ඉහත අයකිරීම්වලට අදාළව 2011.03.31 දිනෙන් අවසන් මාසයේ ආදායම හඳුනාගැනීමට ජර්නල් සටහන ලියන්න.

................................................................................

................................................................................

40. ආයතනයක් භාණ්ඩ ඒකකයක් රු. 50 බැගින් අලෙවි කරයි. භාණ්ඩයේ විකුණුම් මත දායක අනුපාතය 40% කි. වර්තමාන විකුණුම් ධාරිතාව ඒකක 1 100 ක් වන අතර පහත සඳහන් විකුණුම් උපක්‍රම සලකා බලමින් සිටියි. වර්තමාන විකුණුම් ධාරිතාවේදී ආයතනය ලාභ ලබමින් සිටියි.

උපක්‍රම 1 : ඒකකයක විකුණුම් මිල රු. 55 දක්වා වැඩි කිරීම. (මෙමගින් විකුණුම් ප්‍රමාණය ඒකක 900 දක්වා අඩු වේ.)

උපක්‍රම 2 : ඒකකයක විකුණුම් මිල රු. 45 දක්වා අඩු කිරීම. (මෙමගින් විකුණුම් ප්‍රමාණය ඒකක 1 600 දක්වා වැඩි වේ.)

(අ) **උපක්‍රම 1** අනුගමනය කරන්නේ නම් ලාභය කොපමණ ප්‍රමාණයකින් අඩුවන්නේ ද නැතහොත් වැඩිවන්නේ ද යන්න දක්වන්න.

.......................................................................................................................................

(ආ) කුමන උපක්‍රමය ආයතනයට වඩාත් ලාභදායි වේ ද?

.......................................................................................................................................

41. ආයතනයක තොගය A හා B යන අයිතම දෙකෙන් සමන්විත වේ. 2011.03.31 දිනට තොග ශේෂයන්ට අදාළව පහත තොරතුරු ලබා දී ඇත.

| තොග අයිතමය | භෞතික ශේෂය (ඒකක) | පොත්වලට අනුව ශේෂය (ඒකක) | ඒකක පිරිවැය (රු.) | අපේක්ෂිත ඒකකයක විකුණුම් මිල (රු.) | අපේක්ෂිත ඒකකයක විකුණුම් වියදම් (රු.) |
|---|---|---|---|---|---|
| A | 1 000 | 1 000 | 40 | 75 | 15 |
| B | 800 | 900 | 70 | 65 | 5 |

(අ) අයිතම ක්‍රමය යටතේ තොග අගය කරන්නේ නම් 2011.03.31 දිනට ශේෂ පත්‍රයේ දක්විය යුතු තොග අගය

රු. .......................................................................................................................................

(ආ) තොග අයිතම 'B' හි භෞතික සහ පොත්වල ශේෂ අතර වෙනස අපේක්ෂිත විකුණුම් මිල යටතේ ගබඩා භාරකරුගෙන් අයකරගන්නේ යැයි උපලක්ෂනය කරමින් තොග වෙනස පොත්වල ගැලපීම සඳහා ජර්නල් සටහන ලියන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

42. "මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය මගින් එම කාලය තුළ ආයතනය අනිවාර්යයෙන්ම ලාභයක් උපයා ඇතැයි යන්න ගම්‍ය කරයි."

(අ) ඔබ ඉහත ප්‍රකාශනයට එකඟ වන්නේ ද?

.......................................................................................................................................

(ආ) ඉහත (අ) හි පිළිතුර සාධාරණීකරණය කිරීමට හේතුවක් දක්වන්න.

.......................................................................................................................................

43. මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් ලෙස ඉදිරිපත් කරනු ලබන **"ගිණුම් සටහන්"** මූල්‍ය තොරතුරුවල පහත එක් එක් ගුණාත්මක ලක්ෂණය තහවුරු කරන්නේ ද නැද්ද යන්න දක්වීම සඳහා අදාළ තීරුවේ (✓) ලකුණ යොදන්න.

| **ගුණාත්මක ලක්ෂණය** | **තහවුරු කරයි** | **තහවුරු නොකරයි** |
|---|---|---|
| විශ්වාසවන්තභාවය | .................... | .................... |
| අදාළ බව | .................... | .................... |
| සංසන්දනය කළ හැකි බව | .................... | .................... |
| තේරුම්ගත හැකි බව | .................... | .................... |

[ එකොළොස්වෙනි පිටුව බලන්න.

44. පහත සඳහන් තොරතුරු එකම කර්මාන්තයේ නියැලෙන ආයතන දෙකකට අදාළ වේ.

| | A සමාගම (රු. මිලියන) | B සමාගම (රු. මිලියන) |
|---|---|---|
| 2011.03.31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් | 1 200 | 2 000 |
| 2011.03.31 දිනට මුළු හිමිකම | 800 | 450 |
| 2011.03.31 දිනට මුළු වගකීම් | 200 | 150 |

(අ) **වැඩිම** වත්කම් පිරිවැටුම් අනුපාතයක් ඇති සමාගම නම් කරන්න.

..........................................................................

(ආ) 2011.03.31 දිනට **වැඩිම** අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ හැකියාව පෙන්වන සමාගම **හේතුවද** සහිතව නම් කරන්න.

..........................................................................

45. පහත දී ඇති එක් එක් අරමුණට අදාළ **මූලාශ්‍ර ලියවිල්ල** නම් කරන්න.

| අරමුණු | මූලාශ්‍ර ලියවිල්ල |
|---|---|
| ගබඩාව විසින් භාණ්ඩ ලද බව තහවුරු කිරීම. | .................................... |
| නිෂ්පාදන දෙපාර්තමේන්තුවක් විසින් අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය ගබඩාවට දන්වීම. | .................................... |
| භාණ්ඩ ලබාදෙන ලෙස සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටීම. | .................................... |
| විකුණුම් සිදුවී ඇති බව තහවුරු කිරීම. | .................................... |

46. පහත දී ඇත්තේ ආයතනයක මාසයක් සඳහා වූ වැටුප් සාරාංශයයි.

| **විස්තරය** | **(රු '000)** |
|---|---|
| මූලික වැටුප | 250 |
| දීමනා | 20 |
| **දළ වැටුප** | **270** |
| සේවක ණය අඩුකිරීම් | (45) |
| E.P.F. අඩුකිරීම් | (25) |
| ශුද්ධ වැටුප | 200 |

ඉහත තොරතුරුවලට පාදකව, මාසයේ වැටුප වාර්තා කිරීම සඳහා ජර්නල් සටහන ලියන්න.

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

47. සෝමපාල සහෝදරයෝ එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ආයතනයක් වන අතර 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා VAT පාලන ගිණුමේ සාරාංශය පහත දී ඇත. සියලු ගැනුම් හා විකුණුම් මුදලට සිදු වේ.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| 2010.04.01 දිනට ශේෂය | – | 150 |
| මුදල් (විකුණුම් මත එකතු කළ) | – | 2 500 |
| මුදල් (ගැනුම් මත ගෙවූ) | 650 | – |
| මුදල් (දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවූ) | 1 700 | – |

ගැනුම් මත ගෙවන ලද සියළු VAT අඩු කළ හැකියැයි උපකල්පනය කරමින් 2011.03.31 දිනට VAT වගකීම ගණනය කරන්න.

රු. ..........................................................................

[ දොළොස්වෙනි පිටුව බලන්න.

48. ABC සමාගමේ 2011.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය පහත සඳහන් ආකාරයට ණයගැති ලෙජරය සමඟ සංසන්දනය කර ඇත.

| | (රු '000) |
|---|---|
| ණයගැති පාලන ගිණුමේ ශේෂය | 8 000 |
| එකතු කළා : බොල් ණය අධිගණනය වීම | 50 |
| අඩු කළා : විකුණුම් අධිගණනය වීම | (150) |
| ණයගැති ලෙජරයේ ශේෂය | 7 900 |

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ, ඉහත සැසඳුමෙහි හෙළිදරව් කර ඇති තොරතුරු සැලකිල්ලට නොගැනීමෙනි. වර්ෂයේ ලාභය හා 2011.03.31 දිනට ජංගම වත්කම් පිළිවෙලින් රු. 2 000 000 ක් හා රු. 15 000 000 ක් විය. සැසඳුමෙහි දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසු පහත ද ගණනය කරන්න.

(අ) වර්ෂයේ ලාභය

රු. ..............................................................................................................

(ආ) 2011.03.31 දිනට ජංගම වත්කම්

රු. ..............................................................................................................

49. පහත සඳහන් තොරතුරු නිෂ්පාදිතයකට අදාළ වේ.

| | |
|---|---|
| ඒකක 50 ක් විකුණන විට මුළු පිරිවැය | රු. 65 000 |
| ඒකක 75 ක් විකුණන විට මුළු පිරිවැය | රු. 90 000 |
| විකුණුම් මත දායක අනුපාතය | 50% |

රු. 125 000 ක ලාභයක් ලැබීමට අලෙවි කළ යුතු ඒකක ප්‍රමාණය ගණනය කරන්න.

..............................................................................................................

50. 2008.04.01 දින ආරම්භ කරන ලද වෘත්තීය සමිතියක් පහත සඳහන් තොරතුරු ලබා දී ඇත.

| අයිතමය | 2011.03.31 දිනට | 2010.03.31 දිනට | 2009.03.31 දිනට |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බැංකුවේ මුදල් | 14 500 | 16 000 | 10 000 |
| සුළු මුදල් | 3 000 | 2 000 | 2 000 |
| ලිපිද්‍රව්‍ය තොගය | 2 000 | 2 500 | 1 500 |
| මුළු වත්කම් | 19 500 | 20 500 | 13 500 |

වෘත්තීය සමිතිය සතුව කිසිදු වගකීමක් එකම වර්ෂයක් අවසානයේදීවත් නොතිබුණේයැයි උපකල්පනය කරමින් පහත ද ගණනය කරන්න.

(අ) 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය හෝ හිගය

රු. ..............................................................................................................

(ආ) 2011.03.31 දිනට සමුච්චිත අරමුදල

රු. ..............................................................................................................

* * *

36487

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

AL/2011/33/S-II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස් :

※ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
※ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

**1.** 2011.03.31 දිනට අශෝක පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර රු. මිලියන | බැර රු. මිලියන |
|---|---|---|
| විකුණුම් | | 464 |
| 2010.04.01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 14 |
| වියදම් | 220 | |
| ගෙවූ ආදායම් බදු | 24 | |
| දේපළ පිරියත සහ උපකරණ | 1 350 | |
| 2011.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ සඳහා සමුච්චිත ක්ෂය | | 200 |
| 10% බැංකු ණය (2010.04.01 දින ලබාගත්) | | 130 |
| ණයගැතියෝ | 168 | |
| ගෙවූ ලාභාංශ | 90 | |
| තොග (පිරිවැයට) | 40 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් මිලියන 10) | | 1 000 |
| 2010.04.01 දිනට රඳවා ගත් ඉපැයුම් | | 300 |
| හිමිකම් කොටස් නිකුතුව | | 250 |
| සන්නාම නාමය | 200 | |
| මුදල් සහ මුදල් සමාන ද | 266 | |
| | 2 358 | 2 358 |

**අතිරේක තොරතුරු :**

(i) ශේෂ පිරික්සුමෙහි දී ඇති **වියදම්** පහත අයිතමවලින් සමන්විත වේ.

| | රු. මිලියන |
|---|---|
| විකුණුම් පිරිවැය | 100 |
| විකුණුම් සහ බෙදාහැරීමේ පිරිවැය | 40 |
| පරිපාලන වියදම් | 30 |
| ක්ෂය | 50 |

(ii) 2010.10.01 වැනි දින සමාගම මෙහෙයුම් කල්බද්දක් යටතේ යන්ත්‍රයක් අත්පත් කර ගන්නා ලදී. කාලපරිච්ඡේදය සඳහා ගෙවූ කල්බදු වාරික රු. මිලියන 12 ක් වූ අතර එම මුදල අතිරේක තොරතුරු අංක (i) හි දක්වා ඇති **විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැයෙහි** ඇතුළත් කර ඇත.

(iii) නිෂ්පාදන දෝෂ හේතුවෙන් සිදුවන අලුත්වැඩියා පිරිවැය ආවරණය කරන වගකීම් සහතිකයක් යටතේ සමාගම භාණ්ඩ අලෙවි කරයි. වගකීම් සහතිකය සඳහා අපේක්ෂිත අලුත්වැඩියා පිරිවැය රුපියල් මිලියන 2 ක් වේ යැයි විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කර ඇත.

(iv) 2011.03.31 වැනි දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. මිලියන 30 කි.

(v) ණය මුදලින් $\frac{1}{5}$ ක් උපචිත පොලිය ද සමඟ ප්‍රථම වාරිකය 2012.03.30 දින ගෙවිය යුතු ය.

[ දෙවැනි පිටුව බලන්න.

(vi) 2010.04.30 දින තිබූ සෑම කොටස් හතරකට ම එක බැගින්, එකක් රු.120 ක් වූ මිලකට කොටස් නිකුත් කරමින්, සමාගම රඳවා ගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් ලෙජර ගිණුම්වල සිදුකර නොමැත.

(vii) 2010.12.31 දින තිබූ සෑම කොටස් පහකටම එක බැගින් හිමිකම් නිකුතුවක් කරන ලදී. සියලුම හිමිකම් පාවිච්චි කරන ලද අතර එකතු කර ගත් මුදල් හිමිකම් නිකුතු ගිණුමකට බැර කර ඇත.

(viii) කාලපරිච්ඡේදය සඳහා ආදායම් බදු ලෙස රු. මිලියන 40 ක් ඇස්තමේන්තු කරන ලදී.

(ix) ශේෂ පිරික්සුමෙහි ණයගැතියෝ දක්වා ඇත්තේ 2011.03.31 දිනට වූ රු. මිලියන 50 ක ණයහිමි ශේෂය හිලව් කිරීමෙන් පසුව ය.

(x) සන්නම් නාමය 2009.04.01 දින අත්පත් කරගෙන ඇත. එය වසර 5 ක කාලපරිච්ඡේදයක් තුළ ක්‍රමක්ෂය කළ යුතු වුව ද ආරම්භයේ සිටම ක්‍රමක්ෂය සිදු කර නොමැත.

(xi) පරිපාලන වියදම් හා බෙදාහැරීමේ පිරිවැය අතර පිළිවෙළින් 3:2 අනුපාතයට ක්ෂය බෙද හැරිය යුතුයි.

(xii) මුදල් සහ මුදල් සමාන ද තුළ රු. මිලියන 5 ක බැංකු අයිරාවක් සහ මාස දෙකකින් කල්පිරෙන රු. මිලියන 1 ක භාණ්ඩාගාර බිල්පත් ඇතුළත් වේ.

(xiii) රු. මිලියන 4 ක ආපසු එවුම් ලෙජරයට පිටපත් කර නොමැත.

**අවශ්‍ය වන්නේ,**

(1) 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රඳවාගත් ඉපැයුම් ගිණුම

(2) 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(3) 2011.03.31 දිනට ශේෂ පත්‍රය

(4) වටිනාකම් සහිතව ආදායම් ප්‍රකාශනයේ සටහන්වල හෙළිදරව් කළ යුතු අයිතම හතරක්

*(ලකුණු 20 යි)*

**2. (අ)** පහත සඳහන් එකඟතා යටතේ **සුනෙත්** සහ **ප්‍රියත්** විසින් හවුල්ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

- **සුනෙත්**ට සහ **ප්‍රියත්**ට පිළිවෙලින් රු. 20 000 හා රු.15 000 ක මාසික වේතනයක් ගෙවනු ලැබේ.
- **සුනෙත්**ට සහ **ප්‍රියත්**ට පිළිවෙලින් රු. 5 000 හා රු.10 000 බැගින් ප්‍රාග්ධනය මත මාසික පොලියක් ගෙවනු ලැබේ.
- ලාභඅලාභ සමසම ව **සුනෙත්** සහ **ප්‍රියත්** අතර බෙද ගනු ලැබේ.
- හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් දරන ලද සියලු වියදම් ප්‍රතිපූරණය කරනු ලැබේ.
- ව්‍යාපාරය විසින් ගෙවන ලද හවුල් කරුවන්ගේ පෞද්ගලික වියදම් ඔවුන් විසින් හවුල් ව්‍යාපාරයට ලබා දිය යුතු ය.

2011.03.31 දින **දිනෙත්** හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. ව්‍යාපාරයට ඇතුළත් **වීමේ දී** ඔහු විසින් මුදලින් රු. 1 200 000 ක් සහ රු. 800 000 ක එකඟ වූ වටිනාකමකට මෝටර් රථයක් ගෙන එන ලදී. **ඉන්** අනතුරුව සියලු හවුල්කරුවන් ලාභ අලාභ සම සමව බෙද ගැනීමට එකඟ විය. 2011.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්ති නාමය රු. 1500 000 ලෙස එකඟ වූ අතර, ඒ සඳහා ගැලපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් **තුළින්** සිදු කළ යුතු ය.

2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් පොතේ සාරාංශයක් පහත දී ඇත.

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| 2010.04.01 දිනට ශේෂය | | 400 |
| **ලැබීම් :** | | |
| ණයගැතියන්ගෙන් එකතු කිරීම් | 6 100 | |
| **දිනෙත්** රැගෙන ආ ප්‍රාග්ධනය | 1 200 | |
| බැංකු ණය | 1 300 | 8 600 |
| | | 9 000 |
| **ගෙවීම් :** | | |
| ණයහිමියන්ට ගෙවීම් | 4 200 | |
| වියදම් | 2 350 | |
| උපකරණ | 500 | |
| වේතන - **සුනෙත්** | 200 | |
| **ප්‍රියත්** | 150 | |
| ප්‍රාග්ධනය මත පොළී - **සුනෙත්** | 40 | |
| **ප්‍රියත්** | 100 | |
| ගැනිලි - **ප්‍රියත්** | 125 | |
| **සුනෙත්** දරන ලද වියදම් ප්‍රතිපූරණය | 50 | |
| **ප්‍රියත්ගේ** නිවෙසෙහි විදුලි බිල්පත් | 40 | |
| **සුනෙත්ගේ** දරුවන්ගේ උපකාරක පන්ති ගාස්තු | 25 | |
| ප්‍රතිපූරණය කළ ඉන්ධන බිල් - **සුනෙත්** | 150 | |
| **ප්‍රියත්** | 70 | 8 000 |
| 2011.03.31 දිනට ශේෂය | | 1 000 |

[ තුන්වැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු.**

(i) 2010.04.01 දිනට මුළු හිමිකම සහ ප්‍රාග්ධන ගිණුම් ශේෂ පහත පරිදි විය.

| | සුනෙත් (රු.'000) | ප්‍රියත් (රු..'000) |
|---|---|---|
| මුළු හිමිකම | 2800 | 2600 |
| ප්‍රාග්ධන ගිණුම | 2000 | 2500 |

(ii) 2011.03.31 දින දක්වා බැංකු ණය මත රු. 10 000 ක පොලියක් උපචිත කළ යුතු ය.

(iii) වර්ෂය සඳහා දේපළ පිරියත සහ උපකරණ මත ක්ෂය රු. 175 000 කි.

(iv) 2010.03.31 දිනට වගකීම් සහ මුදල් හැර ජංගම වත්කම්:

| | (රු.'000) |
|---|---|
| ණයහිමියෝ | 300 |
| උපචිත වියදම් | 40 |
| තොග | 225 |
| ණයගැතියෝ | 360 |
| ඉදිරියට ගෙවූ වියදම් | 15 |

(v) 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වගකීම් සහ ජංගම වත්කම්වල (මුදල් සහ උපචිත පොලිය හැර) ශුද්ධ වැඩි වීම/(අඩු වීම):

| | (රු.'000) |
|---|---|
| බැංකු ණය | 1 300 |
| ණයහිමියෝ | (20) |
| උපචිත වියදම් | 25 |
| තොග | (15) |
| ණයගැතියෝ | 40 |
| ඉදිරියට ගෙවූ වියදම් | 5 |

**අවශ්‍ය වන්නේ,**

(1) 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(2) වර්ෂයේ ලාභය / අලාභය හවුල්කරුවන් අතර විසර්ජනය කළ ආකාරය පෙන්නුම් කරන ප්‍රකාශනයක්

(3) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්

(4) 2011.03.31 දිනට ශේෂ පත්‍රය *(ලකුණු 12 යි)*

**(ආ)** අපේක්ෂිත විකුණුම් ධාරිතාව ඒකක 12 000 ක් වන විට දී, එක්තරා භාණ්ඩයකට අදාළ තොරතුරු පහත දක්වේ.

| | |
|---|---|
| ලාභය | රු. 400 000 |
| ස්ථාවර පිරිවැය | රු. 200 000 |
| දායක විකුණුම් අනුපාතය | 20% |

**අවශ්‍ය වන්නේ,**

(1) විකුණුම් ධාරිතාව ඒකක 12 000 ක් වන විට දී මුළු දායකය

(2) සමච්ඡේද ලක්ෂ්‍යයේදී විකුණුම් වටිනාකම

(3) ආරක්ෂිත ආන්තිකය

(4) ඒකකයට රු. 10 බැගින් විකුණුම් කොමිස් ගෙවන්නේනම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස විකුණුම් ධාරිතාව ඒකක 15 000 දක්වා වැඩි වන්නේ නම් ලාභයට ඇති වන ශුද්ධ බලපෑම.

(5) විකුණුම් කොමිස් නැතිව සහ ඇතිව සමච්ඡේද ලක්ෂ්‍ය (BEP) පෙන්නුම් කරමින් **සමච්ඡේද ලක්ෂ්‍ය ප්‍රස්තාරය** (මුළු ආදායම් වක්‍රය සහ මුළු වියදම් වක්‍රය භාවිත කරන්න. පරිමාණය අනවශ්‍යයි.)

*(ලකුණු 08 යි)*

*(මුළු ලකුණු 20 යි)*

[ හතරවැනි පිටුව බලන්න.

3. (අ) පහත තොරතුරු 2010.04.01 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද පුබුදු ව්‍යාපාරයට අදළ වේ.

**2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් ප්‍රකාශනය**

| | (රු.'000) |
|---|---|
| විකුණුම් | 500 |
| විකුණුම් පිරිවැය | (300) |
| දළ ලාභය | 200 |
| බෙදාහැරීමේ වියදම් | (30) |
| පරිපාලන වියදම් | (50) |
| මූල්‍ය වියදම් | (20) |
| වර්ෂයේ ලාභය | **100** |

**2011.03.31 දිනට ශේෂ පත්‍රය**

| | (රු.'000) |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 300 |
| තොග | 25 |
| ණයගැතියෝ | 40 |
| ඉදිරියට ගෙවූ වියදම් | 60 |
| මුදල් | 75 |
| **මුළු වත්කම්** | **500** |
| ප්‍රාග්ධනය | 250 |
| රඳවා ගත් ඉපැයුම් | 80 |
| බැංකු ණය | 100 |
| ණයහිමියෝ | 35 |
| උපචිත වියදම් | 20 |
| බැංකු අයිරාව | 15 |
| **මුළු හිමිකම සහ වගකීම්** | **500** |

**අතිරේක තොරතුරු :**

(i) පරිපාලන වියදම් තුළ රු. 5 000 ක ක්ෂය ඇතුළත් වේ.
(ii) උපචිත වියදම් තුළ රු. 10 000 ක ගෙවිය යුතු පොළී ඇතුළත් වේ.
(iii) ණය මුදලෙන් රු. 25 000 ක් වර්ෂය තුළ දී ආපසු ගෙවන ලදී.
(iv) වර්ෂය තුළ දී ජංගම නොවන වත්කම් ඉවත් කිරීම් නොමැත.

**අවශ්‍ය වන්නේ,**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 ට අනුව 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

*(ලකුණු 10 යි)*

(ආ) පහත දී ඇති තොරතුරු RM1 අමුද්‍රව්‍ය ට අදළ වේ.

(i) ගබඩා ලෙජරයේ සාරාංශය

| **දිනය** | **විස්තරය** | **ඒකක ප්‍රමාණය** |
|---|---|---|
| 2011.06.01 | ශේෂය | 5 000 |
| 2011.06.10 | ගැනුම් | 10 000 |
| 2011.06.15 | නිෂ්පාදනාගාරයට නිකුත් කිරීම් | 8 000 |
| 2011.06.20 | නිෂ්පාදනාගාරයෙන් ආපසු එවුම් | 500 |
| 2011.06.21 | සැපයුම්කරුවන්ට ආපසු යැවුම් | 1 000 |
| 2011.06.30 | ගැනුම් | 10 000 |

(ii) 2011.06.01 දින සහ 2011.06.30 දින නිෂ්පාදනාගාරය තුළ RM1 ද්‍රව්‍යයේ ශේෂයන් පිළිවෙළින් ඒකක 1 700 ක් සහ 200 ක් විය.
(iii) 2011 ජූනි මාසය ආරම්භයේ සිට RM1 හි ඒකකයක මිල රු.10 සිට රු.15 දක්වා වැඩි වී ඇත.
(iv) නිෂ්පාදනාගාරයෙන් ආපසු එවුම් තුළ ඇතුළත් වූයේ 2011 ජූනි මාසය තුළ නිකුත් කරන ලද අයිතම පමණි.
(v) පෙර පිවිසුම් පෙර පිට (FIFO) ක්‍රමයට තොග අගය කරනු ලැබේ.
(vi) දිනක උපරිම පරිභෝජනය ඒකක 700 කි.
(vii) උපරිම පොරොත්තු කාලය දින 10 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) නිෂ්පාදනාගාරය තුළ දිනක සාමාන්‍ය පරිභෝජනය
(2) යළි ඇණවුම් මට්ටම
(3) යළි ඇණවුම් ප්‍රමාණය
(4) ජූනි 30 දිනට තොගයෙහි වටිනාකම

*(ලකුණු 05 යි)*
*(මුළු ලකුණු 15 යි)*

4. (අ) 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාගමකට අදාළ ව පහත තොරතුරු ලබා දී ඇත.

(i) **ණයගැති ලෙජරයේ සාරාංශය** (රු. '000)

| | **අමල්** | **බිමල්** | **චමිලා** | **එකතුව** |
|---|---|---|---|---|
| 2010.04.01 දිනට ශේෂය | 100 | 250 | 150 | 500 |
| විකුණුම් | 800 | 1200 | 850 | 2850 |
| ආපසු එවුම් | - | (50) | - | (50) |
| දුන් වට්ටම් | (9) | - | - | (9) |
| මුදල් ලැබීම් | (741) | (1200) | (550) | (2491) |
| **2011.03.31 දිනට ශේෂය** | **150** | **200** | **450** | **800** |

(ii) **ණයහිමි ලෙජරයේ සාරාංශය** (රු. '000)

| | **ප්‍රසන්න** | **ජයන්ත** | **එකතුව** |
|---|---|---|---|
| 2010.04.01 වැනි දිනට ශේෂය | 80 | 170 | 250 |
| ගැනුම් | 1300 | 930 | 2230 |
| ආපසු යැවුම් | (30) | - | (30) |
| ලද වට්ටම් | (10) | - | (10) |
| මුදල් ගෙවීම් | (1200) | (850) | (2050) |
| **2011.03.31 දිනට ශේෂය** | **140** | **250** | **390** |

(iii) පාලන ගිණුම්වල ආරම්භක ශේෂ ණයගැති හා ණයහිමි ලෙජර් ගිණුම්වල ආරම්භක ශේෂ එකතුව සමග සමාන විය.

(iv) කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව වර්ෂයේ ලාභය රු. 1300000 කි.

(v) පහත දී ඇති තොරතුරු **නොසලකා හරිමින්** කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

- ණයගැති පාලන ගිණුමට සහ විකුණුම් ගිණුමට රු. 600000 ක වැඩිපුර වටිනාකමක් පිටපත් කර ඇත.
- ආපසු එවුම්, ආපසු යැවුම්, දුන් වට්ටම් සහ ලද වට්ටම් සඳහා ජ'නල් සටහන් තබා නොමැත.
- 2011.03.31 දිනට චමිලාගේ ශේෂය මත අඩමාන ණය සඳහා 10% ක විශේෂ වෙන් කිරීමක් සිදු කළ යුතුයි.

**අවශ්‍ය වනුයේ,**

(1) ගැලපීම් සිදු කිරීමට පෙර ණයගැති පාලන ගිණුමෙහි සහ ණයහිමි පාලන ගිණුමෙහි ශේෂ

(2) ණයගැති පාලන ගිණුමෙහි ගැලපීම්

(3) 2011.03.31 දිනට ණයගැතියන්ගේ ධාරණ අගය

(4) වර්ෂයේ ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනයක් *(ලකුණු 10 යි)*

(ආ) සාමාජිකයන් 5 දෙනකු සමගින් 2009.04.01 වැනි දින 'යුනයිටඩ්' ක්‍රීඩා සමාජය ආරම්භ කරන ලදී. එදිනම පරිත්‍යාග ලෙස රු. 500 000 ක් වටිනා ක්‍රීඩා උපකරණ ලැබී ඇත. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 1 000 කි. පහත තොරතුරු ලබා දී තිබුණි.

(i) **සාමාජික ලේඛනයේ සාරාංශය :**

| සාමාජිකයන් | සාමාජිකයින් ගණන | මාර්තු 31 දිනට සාමාජික ගාස්තු ගෙවන ලද සාමාජිකයින් ගණන: | |
|---|---|---|---|
| | | 2009/10 | 2010/11 |
| ආරම්භක | 5 | 5 | 5 |
| 2009/10 දී ඇතුළත් වූ | 20 | 18 | 10 |
| 2010/11 දී ඇතුළත් වූ | 32 | - | 32 |

(ii) 2009/10 වර්ෂයේදී ඇතුළත් වූ සාමාජිකයින්ගෙන් 7 දෙනෙක් 2010/11 වර්ෂය ආරම්භයේදී ඉවත්විය.

(iii) 2010/11 දී ඉවත් වූ සාමාජිකයින් 7 දෙනාගෙන් 2 දෙනෙක් 2009/10 දී වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නොතිබුණි.

(iv) 2010/11 වර්ෂයේදී ඇතුළත් වූ සාමාජිකයින් 5 දෙනෙක් ඉදිරි වර්ෂය සඳහා ද සාමාජික මුදල් ගෙවා තිබුණි.

(v) වර්ෂ 5 ක් ඇතුළත පරිත්‍යාග සමානව ආදායම් ලෙස හඳුනාගත යුතුයි.

(vi) 2009/10 වර්ෂය සඳහා පරිත්‍යාග හැර වෙනත් ආදායම් සහ ක්ෂය හැර මුළු වියදම් පිළිවෙළින් රු. 175 000 ක් සහ රු. 125 000 ක් විය.

(vii) ක්‍රීඩා උපකරණ වර්ෂ 5 ක් ඇතුළත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(viii) 2011.03.31 දිනට මුදල් ශේෂය රු. 412 000 ක් විය.

(ix) වෙනත් කිසිදු වත්කමක් හෝ වගකීමක් ක්‍රීඩා සමාජය සතු නොවී ය.

**අවශ්‍ය වන්නේ,**

(1) 2009/10 වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය.

(2) 2010/11 වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම.

(3) 2011.03.31 දිනට සමුච්චිත අරමුදල. *(ලකුණු 05 යි)*

*(මුළු ලකුණු 15 යි)*

[ හයවැනි පිටුව බලන්න.

5. (අ) 2011.03.31 දිනට කසුන් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පහත දී ඇත.

| | සටහන | රු.'000 |
|---|---|---|
| යන්ත්‍ර | 1 | 300 |
| තොග | | 100 |
| ණයගැතියෝ | | 50 |
| කාර්යාලීය ලිපිද්‍රව්‍ය | | 30 |
| මුදල් | 2 | 20 |
| **මුළු වත්කම්** | | **500** |
| හිමිකම් | | 440 |
| ණයහිමියෝ | | 60 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **500** |

**සටහන 1:** 2011.03.31 දිනට ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙහි ශේෂය රු. 200 000 ක් විය.

**සටහන 2:** මුදල් ශේෂය තුළ රු. 2 000 ක සුළු මුදල් ශේෂයක් අඩංගු වේ.

පහත ගණුදෙනු හා සිද්ධීන් 2011 අප්‍රේල් මාසයට අදළ වේ.

(i) මුදල් ලැබීම් හා ගෙවීම් සාරාංශය
- ණය ගැතියන්ගෙන් ලැබීම් රු. 590 000
- බොල් ණය ආපසු ලැබීම් රු. 20 000
- සැපයුම්කරුවකුට ගෙවූ අත්තිකාරම් රු. 30 000
- සැපයුම්කරුවන්ට ගෙවීම් රු. 370 000
- කාර්යාලීය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් රු. 5 000
- සුළු මුදල් ප්‍රතිපූර්ණය රු. 12 000
- වියදම් රු. 135 000

(ii) 2011.04.30 වැනි දින යන්ත්‍රයක් රු. 100 000 කට ණයට අත්පත් කර ගන්නා ලදී.

(iii) මුළු විකුණුම් රු. 600 000

(iv) මුළු ගැනුම් රු. 400 000

(v) සුළු මුදල් වියදම් ගෙවීම් රු. 8 000

(vi) යන්ත්‍ර ක්ෂය රු. 5 000

(vii) පරිභෝජනය කළ කාර්යාලීය ලිපිද්‍රව්‍ය රු. 10 000

(viii) මුළු වියදම් (විකුණුම් පිරිවැය, සුළු මුදල් වියදම්, ක්ෂය හා ලිපිද්‍රව්‍ය හැර) රු. 150 000

(ix) විකුණුම් මත 40% ක දළ ලාභ අනුපාතයක් පවත්වාගෙන යයි.

(x) තොග ඇපයට තබා ගනිමින් බැංකුව විසින් රු. 200 000 ක බැංකු අයිරා පහසුකමක් අනුමත කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

(1) 2011 අප්‍රේල් මාසයේ ආරම්භක ශේෂ ගිණුම්ගත කිරීමට ජ'නල් සටහන්

(2) 2011 අප්‍රේල් මාසය සඳහා මුදල් ගිණුම

(3) 2011.04.30 දිනට ශේෂ පත්‍රය *(ලකුණු 10 යි)*

(ආ) සමාගමක් වර්ෂ 3 ක කාලයක් ඇතුළත LED රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කර අලෙවි කිරීමට අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතියට අදළ තොරතුරු පහත දී ඇත.

(i) වෙළෙඳපොළ සමීක්ෂණය සඳහා වැය කළ මුදල රු. 200 000 කි.

(ii) රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කිරීමට භාවිත කරන යන්ත්‍රවල අපේක්ෂිත ආයෝජනය රු. 1 200 000 කි. තුන්වන වර්ෂය අවසානයේ දී මෙම අගයෙන් 1/4 ක් උපලබ්ධි වේ.

(iii) දෙවන වර්ෂය අවසානයේ දී පිරිවැය රු. 100 000 ක් වූ යන්ත්‍ර අමතර කොටස් ප්‍රතිසම්පාදනය කිරීමට අපේක්ෂා කරයි.

(iv) මෙම ව්‍යාපෘතිය නිසා සමාගමේ කාරක ප්‍රාග්ධනය රු. 200 000 සිට රු. 250 000 දක්වා වැඩි වේ. මෙම අතිරේක කාරක ප්‍රාග්ධනය ව්‍යාපෘතිය අවසානයේ දී උපලබ්ධි වේ.

(v) අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය සහ විකුණුම් ප්‍රමාණය රූපවාහිනී යන්ත්‍ර 50 කි.

(vi) රූපවාහිනී යන්ත්‍රයක අපේක්ෂිත විකුණුම් මිල රු. 100 000 කි.

(vii) රූපවාහිනී යන්ත්‍රයක අපේක්ෂිත විචල්‍ය පිරිවැය රු. 80 000 කි.

(viii) ව්‍යාපෘතිය නිසා ඇති වන වාර්ෂික ස්ථාවර පිරිවැය (යන්ත්‍ර ක්ෂය ද ඇතුළුව) රු. 800 000 කි.

(ix) ව්‍යාපෘතියෙහි අවශ්‍යකරන වාර්ෂික ප්‍රතිලාභ අනුපාතය 20% ක් වන අතර 20% අනුපාතය යටතේ රුපියලක වට්ටම් සාධක පහත දී ඇත.

| කාලච්ඡේදය | වට්ටම් සාධකය |
|---|---|
| 1 වර්ෂය | 0.8 |
| 2 වර්ෂය | 0.7 |
| 3 වර්ෂය | 0.6 |

**අවශ්‍ය වන්නේ,**

(1) ව්‍යාපෘතියෙහි වාර්ෂික මුදල් ප්‍රවාහයන් ගණනය කිරීම.

(2) ව්‍යාපෘතිය ඇගයීමට අදළ නොවන පිරිවැය අයිතම **දෙකක්.**

(3) ව්‍යාපෘතියෙහි ශුද්ධ වර්තමාන අගය සහ ව්‍යාපෘතිය භාරගත යුතු ද යන්න නිර්දේශ කිරීම. *(ලකුණු 05 යි)*

*(මුළු ලකුණු 15 යි)*

[ හත්වැනි පිටුව බලන්න.

6. (අ) පහත සඳහන් තොරතුරු තමාරා පොදු සමාගමෙහි දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ වේ.

| අයිතමය | පිරිවැය / ප්‍රත්‍යාගණන අගය 2010.03.31 දිනට (රු.000) | 2010.03.31 දිනට සමුච්චිත ක්ෂය (රු.000) | ඵලදායී ජීව කාලය (වසර) | සුන්බුන් අගය (රු.000) |
|---|---|---|---|---|
| ඉඩම් | 2 000 | – | – | – |
| ගොඩනැගිලි | 3 000 | 500 | 40 | 1 000 |
| උපකරණ අංක 1 | 500 | 400 | 4 | 100 |
| උපකරණ අංක 2 | 200 | 200 | 5 | 0 |
| මෝටර් රථ අංක 1 | 1 000 | 600 | 4 | 200 |
| මෝටර් රථ අංක 2 | 4 000 | 800 | 4 | 800 |

**අතිරේක තොරතුරු :**

(i) 2010.04.01 වැනි දින රු. 450 000 කට උපකරණයක් අත්පත් කර ගන්නා ලදී. උපකරණය සවිකිරීම සඳහා රු. 50 000 ක වියදමක් දරන ලදී. 2010.07.01 දින සවිකිරීම නිම කරන ලද අතර එදින සිට උපකරණය භාවිතයට හැකි මට්ටමක පැවතිනි. මෙම උපකරණයේ ඵලදායී ජීව කාලය වසර 5 ක් වන අතර සුන්බුන් අගයක් නොමැත.

(ii) 2011.03.31 දින ඉඩම් සහ ගොඩනැගිලි වෙන වෙනම රු. 4 000 000 බැගින් ප්‍රත්‍යාගණනය කරන ලදී.

(iii) 2010.09.30 දින අංක 1 මෝටර් රථය හුවමාරු කරමින් නව මෝටර් රථයක් රු. 1 200 000 කට අත්පත් කර ගන්නා ලදී. මෙදිනට අංක 1 මෝටර් රථයේ හුවමාරු අගය රු. 400 000 ක් විය. ශේෂය මුදලින් ගෙවන ලදී. නව මෝටර් රථයට වසර 4 ක ඵලදායී ජීව කාලයක් ඇති අතර එහි සුන්බුන් අගය රු. 200 000 ක් විය.

(iv) දේපළ, පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමයට අනුව ක්ෂය කරනු ලබයි.

**අවශ්‍ය වන්නේ,**

(1) 2011.03.31 දිනට ශේෂ පත්‍රයේ සටහන් (SLAS 18 ට අනුව හෙළිදරව් කිරීම්) ලෙස ඇතුළත් කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ ලේඛනයක්

(2) මෝටර් රථය හුවමාරුව නිසා ඇති වූ ලාභය හෝ අලාභය

(3) ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් ඇතිවූ අතිරික්තය / හිඟය වාර්තා කිරීමට ජර්නල් සටහන

(ලකුණු 10 යි)

(ආ) ආයතනයක X සහ Y යන නිෂ්පාදිත දෙකට අදාළ තොරතුරු පහත දැක්වේ.

(i) සත්‍ය නිෂ්පාදිතයට අදාළ තොරතුරු

| | නිෂ්පාදිතය X | නිෂ්පාදිතය Y | එකතුව |
|---|---|---|---|
| නිෂ්පාදන ප්‍රමාණය (ඒකක) | 10 000 | 5 000 | |
| සෘජු අමුද්‍රව්‍ය පිරිවැය (රු.) | 100 000 | 500 000 | |
| සෘජු ශ්‍රම පිරිවැය - පුහුණු (රු.) | 125 000 | 75 000 | |
| - අර්ධ පුහුණු (රු.) | 150 000 | 25 000 | |
| යන්ත්‍ර පැය | 8 000 | 7 000 | 15 000 |
| සෘජු ශ්‍රම පැය - අර්ධ පුහුණු | 2 000 | 4 000 | 6 000 |
| නිෂ්පාදන පොදුකාර්ය (රු.) | | | 760 000 |

(ii) ඒ ඒ දෙපාර්තමේන්තුවෙහි අයවැයගත පොදුකාර්ය සහ පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

| දෙපාර්තමේන්තුව | පොදු කාර්ය (රු.) | අන්තර්ග්‍රහණ අනුපාතය |
|---|---|---|
| යන්ත්‍ර දෙපාර්තමේන්තුව | 510 000 | යන්ත්‍ර පැයකට රු. 30 බැගින් |
| එකලස් දෙපාර්තමේන්තුව | 300 000 | අර්ධ පුහුණු ශ්‍රම පැයකට රු. 50 බැගින් |

**අවශ්‍ය වන්නේ,**

(1) පිරිවැය මූලිකාංග දක්වමින් X හා Y ඒකකයක පිරිවැය දක්වන ප්‍රකාශනයක්

(2) අධි / (ඌණ) පොදුකාර්ය අන්තර්ග්‍රහණය

(ලකුණු 05 යි)
(මුළු ලකුණු 15 යි)

7. (අ) පහත සඳහන් තොරතුරු සමාගමකට අදාළ වේ.

(i) 2011.03.31 දිනට තෝරාගත් ලෙජර් ගිණුම් ශේෂයන්

| **ලෙජර් ගිණුම** | **රු.'000** |
|---|---|
| ණයගැතියෝ | 500 |
| බැංකුවේ ඇති මුදල් | 50 |
| වාහන අලුත් වැඩියා වියදම් | 120 |
| වාහන අලුත් වැඩියා සඳහා වෙන් කිරීම් | 120 |
| බොල් ණය | 25 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් | 25 |
| කුලී වියදම් | 165 |

(ii) වාහනයක් අනතුරකට ලක් වී තිබූ අතර ඒ සඳහා ඇස්තමේන්තු මත පදනම්ව අලුත්වැඩියා වියදම් ලෙස රු. 120 000 ක් උපචිත කරන ලදී. **2011 අප්‍රේල්** මාසයේදී අලුත්වැඩියාව සඳහා ගෙවන ලද සත්‍ය වියදම රු. 110 000 කි.

(iii) 2011 මාර්තු මාසයේ බැංකු ප්‍රකාශනයේ පෙන්නුම් කරන එහෙත් ලෙජර් ගිණුම්වල ගැලපුම් නොකරන ලද අයිතම

- වාහන අලාභය වෙනුවෙන් වූ රක්ෂණ ඉල්ලීම් සඳහා ලද සෘජු ප්‍රේෂණ රු. 100 000
- ණය ගැතියන්ගෙන් ලද සෘජු ප්‍රේෂණ රු. 50 000
- මාසික කුලී සඳහා කළ නිත්‍ය නියෝග ගෙවීම් රු. 15 000
- බැංකු ගාස්තු රු. 5 000

(iv) 2011.03.31 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් හා ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් පිළිවෙළින් රු.80 000 ක් හා රු. 35 000 ක් විය.

(v) සෑම මාසයක් අවසානයේ ම ණයගැති ශේෂය මත 5% ක් අඩමාන ණය සඳහා වෙන් කළ යුතුය.

(vi) 2011 මාර්තු මාසයේ දී සමාගම වෙනුවෙන් අධ්‍යක්ෂවරු රු. 135 000 ක් ගමන් වියදම් සඳහා වැය කර ඇත. මෙම මුදල තවමත් ප්‍රතිපූරණය කර නොමැති අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

**අවශ්‍ය වන්නේ,**

(1) 2011.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය

(2) ලෙජර් ගිණුම් ශේෂයන් ගැලපීමට අවශ්‍ය ජර්නල් සටහන් (මුදල් ද ඇතුළුව)

(3) 2011.03.31 දිනට ශේෂ පත්‍ර උද්ධෘතයන් *(ලකුණු 10 යි)*

(ආ) පහත වගුවේ දී ඇති තොරතුරු එක්තරා කර්මාන්තයක නියැලෙන සමාගම් තුනකට අදාළ වේ.

| | **සීමිත A සමාගම** | **සීමිත B සමාගම** | **සීමිත C සමාගම** | **කර්මාන්ත සාමාන්‍ය** |
|---|---|---|---|---|
| මුළු වත්කම් (රු'000) | 2 500 | 3 200 | 6 000 | – |
| බදු පෙර ලාභය (රු'000) | 275 | 420 | 520 | – |
| පොලී වියදම් (රු'000) | 25 | 60 | 80 | – |
| ශුද්ධ වත්කම් (රු'000) | 1 500 | 2 000 | 3 800 | – |
| මුළු වත්කම් සඳහා ප්‍රතිලාභය **(සටහන 1)** | P | 0.15 | 0.10 | 0.12 |
| මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය | 2.0 | 3.3 | 1.5 | 2.1 |
| හිමිකමට ණය **(සටහන 2)** | 0.7 | Q | 0.6 | 0.6 |
| ලාභ ආන්තිකය | 0.06 | 0.05 | 0.07 | 0.05 |
| පොලී ආවරණය (වාර) | R | 8.0 | 7.5 | 15 |
| ජංගම අනුපාතය | 2.0 | 1.2 | 2.8 | 1.8 |

**සටහන 1.** පොලී සහ බදු පෙර ලාභය මුළු වත්කම්වල ප්‍රතිලාභය ලෙස සලකා ඇත.

**සටහන 2.** මුළු වගකීම් මුළු ණය ලෙස සලකා ඇත.

**අවශ්‍ය වන්නේ,**

(1) ඉහත වගුවෙහි **P, Q** සහ **R** යන අක්ෂරයන්ගෙන් නියෝජනය වන අනුපාත

(2) සාපේක්ෂව ඉහළ තෝලනයක් ඇති සමාගම

(3) හේතුවක් සහිත ව, ලාභදායිත්වය අතින් වඩාත් හොඳ සමාගම

(4) සීමිත 'C' සමාගමෙහි මුළු වත්කම්වලට ප්‍රතිලාභ අනුපාතය අඩු වීමට බලපා ඇති හේතු දෙකක්

(5) අනෙක් සමාගම් දෙකට හා කර්මාන්තයට සාපේක්ෂව සීමිත 'A' සමාගමෙහි ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් *(ලකුණු 05 යි)*

*(මුළු ලකුණු 15 යි)*

***